රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99 (XXXII)

මගේ අංකය : EST/6/TPORT/05/1010
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2016.06.24

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම්</u>**

"රජයේ නිලධාරීන්/ අධිකරණ නිලධාරීන්/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්" මැයෙන් නිකුත් කරන ලද 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 දරන චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී විධිවිධානයන්හි 3:5 අනුඡේදය හා එකී ඡේදය යටතේ වන නිලධර කාණ්ඩවල උපරිම මි.ර.ගැ වටිනාකම පහත පරිදි සංශෝධනය කිරීමට 2016.05.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

3:5 (අ) වාහනයක් ආනයනය කිරීමේදී මි.ර.ගැ වටිනාකම නිලධරයා දරන තනතුර අනුව සිලින්ඩර් ධාරිතාවය පිළිබඳ උපරිම සීමාවකින් තොරව කාණ්ඩ 03ක් යටතේ වර්ග කරනු ලැබේ.

කාණ්ඩ (I) - (අ) වාහනයේ මි.ර.ගැ. වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 45, 000 ක උපරිමයට යටත්ව පෙට්‍රල් හෝ ඩීසල් මෝටර් රථයක්/ කැබ් රථයක්.

කාණ්ඩ (II) - (අ) වාහනයේ මි.ර.ගැ. වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 40, 000 ක උපරිමයට යටත්ව පෙට්‍රල් හෝ ඩීසල් මෝටර් රථයක්/ කැබ් රථයක්.

කාණ්ඩ (III) - (අ) වාහනයේ මි.ර.ගැ. වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 35, 000 ක උපරිමයට යටත්ව පෙට්‍රල් හෝ ඩීසල් මෝටර් රථයක්/ කැබ් රථයක්.

**සටහන:** 2012.02.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2012 හි 02.II ඡේදය මඟින් මෙතෙක් ලබාදුන් එ.ජ.ඩොලර් 5, 000 ක අමතර මි.ර.ගැ වටිනාකම මෙයින් ඉවත් කරනු ලැබේ.

3:5 (ආ) ආනයන කරනු ලබන වාහනය වෙනුවෙන් ශ්‍රී ලංකා රේගුව විසින් ගණනය කරනු ලබන මුළු නිෂ්පාදන බදු ප්‍රමාණයෙන් 20%ක ප්‍රමාණයක් බලපත්‍රලාභියා විසින් දැරිය යුතු වේ.

03. මෙම සංශෝධිත චක්‍රලේඛයේ විධිවිධාන අදාළ වන්නේ 2015.11.21 දින හෝ එදිනට පසු විශ්‍රාම ගනු ලබන නිලධරයන් සඳහා පමණක් වන අතර 2015.11.20 දින හෝ ඊට පෙර විශ්‍රාම ගනු ලැබූ මෙතෙක් තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර ලබා නොගත් නිලධරයන් සඳහා තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් එදිනට බලාත්මකව තිබූ කොන්දේසි හා විධිවිධාන අදාළ වේ.

04. රේඛීය අමාත්‍යාංශයක ලේකම්වරයෙකු ලෙස වසර තුනකට (03) වැඩි කාලයක් සේවය කරමින් 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි හෝ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අනුව SL - 04 වැටුප් මට්ටම උපයාගෙන තිබෙන නිලධරයෙකු ඔහුගේ/ ඇයගේ පාලනයෙන් බැහැර හේතූන් මත හෝ විනය කරුණක් නොවන හේතුවක් මත ඊට පහළ තනතුරකට පත්කර සේවයේ යෙදී සිටින අතරතුර විශ්‍රාම ලබා ඇත්නම් එවැනි නිලධරයෙකුට ද අමාත්‍යාංශ ලේකම්වරයෙකුට හිමි කාණ්ඩයට අයත් තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයකට හිමිකම් ලැබේ.

05. මෙම චක්‍රලේඛය යටතේ තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ඉල්ලීම සඳහා භාවිතා කළ යුතු 2014.11.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXX) මඟින් හඳුන්වා තිබූ අයදුම්පත්‍රය වෙනුවෙන් හඳුන්වා දෙන නව අයදුම්පත්‍රය "ඇමුණුම I" මඟින් දැක්වේ.

06. මෙම චක්‍රලේඛය මඟින් සංශෝධිත කොන්දේසිවලට පරිබාහිර වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හා ඊට සංශෝධන ලෙස නිකුත් කරන ලද සියලුම චක්‍රලේඛවල සඳහන් අනෙකුත් කොන්දේසි හා විධිවිධාන තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

07. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ. දඩල්ලගේ

ලේකම්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

ඇමුණුම I"

**විශ්‍රාම ලබන නිලධරයන් විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ**

**තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රය**

**'අ' කොටස**

*වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා පමණයි*

බලපත්‍ර අංකය

| T | 45 | VE | | 002 | | |
|---|---|---|---|---|---|---|

**(අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න.)**

**'ආ' කොටස**

01. (I) මුලකුරු සමඟ නම :- ……………………………………………………………………………..

(II) මුලකුරු වලින් හැඳින්වෙන නම් :- …………………………………………………………………….......

……………………………………………………………………………………………………………

02. (I) උපන් දිනය:- වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(II) ජාතික හැඳුනුම්පත් අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

03. (I) පෞද්ගලික ලිපිනය:- ……………………………………………………………………………

……………………………………………………………………………

……………………………………………………………………………

(II) දුරකථන අංක :-

නිවස [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ජංගම [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

04. විශ්‍රාම ලබන දිනය :- වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

05. විශ්‍රාම ගනු ලබන්නේ :-

(I) වෛකල්පික විශ්‍රාම ගැනීම මත [ ]

(II) අනිවාර්ය විශ්‍රාම ගැනීම මත [ ]

(III) වෙනත් හේතූන් මත නම් එම හේතු සඳහන් කරන්න

……………………………………………………………………………

06. විශ්‍රාම ලබන දිනට ලබමින් සිටි

(I) වැටුප් කේත අංකය :- ……………………………………......................

(II) වැටුප් පරිමාණය :- රු. ………………………………………………

(III) වැටුප් පියවර :- රු. ……………………………………………......

**'ඇ' කොටස**

**07. ඔබ සුදුසුකම් ලබන්නේ 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හි 2 වගන්තිය යටතේ නම්,**

(I) SL 1 -2006 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් සහිත තනතුරකට පත් වූ

දිනය :- වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(II) තනතුරු නාමය :-.........................................................................................................

(III) එම තනතුරට පත්වූයේ:- ස්ථිරව ☐

වැඩ බැලීමේ පදනම මත ☐

රාජකාරි ඉටු කිරීමේ පදනම මත ☐

(අදාළ කොටුවේ " √ " සළකුණ යොදන්න )

(IV) ඉහත සඳහන් චක්‍රලේඛයේ 2 වගන්තිය යටතේ ගැනෙන තනතුරුවල සේවා කාලය පිළිබඳ විස්තර :-

| තනතුරු නාමය | සිට | | | දක්වා | | | තනතුරට පත් කර ඇත්තේ ස්ථිරව/ වැඩ බැලීම / රාජකාරි ඉටු කිරීම සඳහා | සුදුසුකම් ලබන සේවා කාලය |
|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය | මාසය | දිනය | වර්ෂය | මාසය | දිනය | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | එකතුව (අවුරුදු) | |

---

**'ඇ' කොටස**

**08. ඔබ සුදුසුකම් ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XVIII)න් ඇතුළත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 3:6 උප වගන්තිය යටතේ හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXI)න් ඇතුළත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 3:7 උප වගන්තිය යටතේ නම්, (අදාළ කොටුවේ "√" සළකුණ යොදන්න)**

(I) තනතුර:-

රජයේ විශේෂඥ වෛද්‍ය ☐

රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය ☐

I වන ශ්‍රේණියේ රජයේ වෛද්‍ය ☐

I වන ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය ☐

විශේෂ ශ්‍රේණියේ රජයේ ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය ☐

(II) රජයේ වෛද්‍ය නිලධරයෙකු/දන්ත වෛද්‍ය/රජයේ ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය නිලධරයෙකු ලෙස මුල් පත්වීම් දිනය:-

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(III) එකී තනතුරේ වසර 25 ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය:- ........................................

(IV) ඔබ සුදුසුකම් ලබන්නේ රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස නම්,

(අ) රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස උසස්වීම් ලද දිනය:-

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) I ශ්‍රේණියේ රජයේ වෛද්‍ය නිලධරයෙකු/ I ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු/ විශේෂ ශ්‍රේණියේ රජයේ ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය නිලධරයෙකු ලෙස උසස්වීම් ලද දිනය:-

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(V) වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර

.................... සිට ...................... දක්වා

.................... සිට ...................... දක්වා

---

**'ඉ' කොටස**

**09. ඔබ සුදුසුකම් ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXX) හි 4 වගන්තිය යටතේ නම්,**

(I) ඉහත චක්‍රලේඛයෙහි 4:1 හෝ 4:2 යටතේ ගැනෙන සේවයකට හෝ තනතුරකට පත් වූ දිනය

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(II) එම සේවය/ තනතුරේ වසර 25 ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරන දිනය

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(III) SL 1-2006 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට පත් වූ දිනය

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(IV) එකී I ශ්‍රේණියේ වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(V) වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර

.................... සිට ...................... දක්වා

.................... සිට ...................... දක්වා

---

**'ඊ' කොටස**

**10. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට පෙර වසර 05 තුළ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ හෝ වෙනත් චක්‍රලේඛයක් යටතේ තීරු බදු සහන සහිත මෝටර් රථයක් ආනයනය කර ඇත්නම් හෝ දේශීය වශයෙන් එකලස් කරන ලද මෝටර් රථයක් මිල දී ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර:-**

(I) අදාළ චක්‍රලේඛයේ අංකය :-…………………………………………………..........................

(II) ණයවර ලිපි විවෘත කළ දිනය හෝ දේශීය වශයෙන් මිල දී ගනු ලැබු මෝටර් රථය සඳහා පළමු ගෙවීම සිදු කළ දිනය :- ………………………………………………………………………………

(III) වාහනය ආනයනය කළ දිනය :- ……………………………………………………………………………

(IV) මෝටර් රථය ලියාපදිංචි කළ දිනය :- …………………………………………………………………

(V) මෝටර් රථයේ ලියාපදිංචි අංකය :- ……………………………………………………………………

**(මේ සමග ණයවර ලිපියේ /මෝටර් රථය ලියාපදිංචි කළ සහතිකයේ සහතික කළ පිටපතක් හෝ ඒ බව තහවුරු කෙරෙන වෙනත් ලිපි ඉදිරිපත් කළ යුතුය.)**

**11.** **වාහන බලපත්‍රය ඉල්ලා සිටින්නේ මෙම චක්‍රලේඛයෙහි කුමන කාණ්ඩය යටතේ ද යන වග (පහත වගුවේ 3 වන තීරුවෙහි "√" සළකුණ යොදන්න)**

| නිලධර කාණ්ඩය | මි.ර.ගැ. වටිනාකම (ඇ.එ.ජ. ඩොලර්) | අයදුම්කරුට අදාළ කාණ්ඩය |
|---|---|---|
| I | 45,000 | |
| II | 40,000 | |
| III | 35,000 | |

**12.** **ඉල්ලුම්කරු මිය ගොස් ඇති විටෙක අදාළ බලපත්‍රය සඳහා ඉල්ලුම් කරනු ලබන කලත්‍රයා පිළිබඳ විස්තර:-**

(I) සම්පූර්ණ නම:-………………………………………………………………………………………

(II) ජාතික හැඳුනුම්පත් අංකය:-………………………………………………………………………

(III) ලිපිනය:-……………………………………………………………………………………………

(IV) කලත්‍රයා තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් සඳහා මෙම චක්‍රලේඛයේ සුදුසුකම් ලබන වගන්තිය………………………………………………………………………………………

**ඉල්ලුම්කරුගේ ප්‍රකාශය:-**

* රජයේ සේවයෙන් මා විශ්‍රාම ගිය/ රජයේ සේවයේ නියුතුව සිටි මාගේ කලත්‍රයා මිය ගිය දිනය වන ………………………… දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුළ හෝ ඉන් මෙපිට රජයේ අනුග්‍රාහක පදනමක් මත වාහනයක් මා / මගේ කලත්‍රයා විසින් ආනයනය කර නොමැති බව මෙයින් දන්වමි.

එසේම, මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම චක්‍රලේඛයෙහි කොන්දේසිවලට යටත්ව බලපත්‍රය ලබා ගැනීමට මම එකඟ වෙමි. ඉහත තොරතුරුවල වෙනසක් සිදු වුවහොත් නොපමාව ඒ බව දන්වා එවීමට පොරොන්දු වන අතර එම තොරතුරු අසත්‍ය වුවහොත් ගෙන්වා ගනු ලබන වාහනයට අදාළව ලබා දෙන ලද තීරුබදු සහන සියල්ල මාගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කරන බව ද මම දනිමි.

දිනය:- ……………………… ……………………………………………

අයදුම්කරුගේ අත්සන

**(* අනවශ්‍ය වචන කපාහරින්න)**

## ‘උ’ කොටස

## ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

**සටහන:**

අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියමිත පරිදි ජනාධිපති ලේකම්/ අමාත්‍යාංශ ලේකම්/ ප්‍රධාන ලේකම් වෙත මෙම නිර්දේශය ඉදිරිපත් කළ යුතුය. එසේම ඕනෑම ලේකම්වරයකු/ පළාත් ප්‍රධාන ලේකම්වරයකු මෙම ඉල්ලුම්කරුගේ ආසන්නතම ආයතන ප්‍රධානියා වන විට අදාළ ලේකම්වරයා විසින් පහත ‘ඌ’ හෝ ‘එ’ හෝ කොටසට අමතරව මෙම කොටසේ නිර්දේශය ද කළ යුතුය. එවැනි විටකදී ලේකම්වරයාට අමතරව පරිපාලන බලය පවරා ඇති ඊලඟ ප්‍රධානියාට ද මෙම නිර්දේශය කළ හැකිය.

මගේ අංකය:-……………………..…

**(*අනවශ්‍ය වචන කපා හරින්න)**

ලේකම්, ජනාධිපති කාර්යාලය*

ලේකම්, …………………………………………. අමාත්‍යාංශය*

ප්‍රධාන ලේකම්, ..................................................පළාත් සභාව*

අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*/#

**(# ලේකම්වරයාම පෞද්ගලිකව මෙම නිර්දේශය කරන අවස්ථාවලදී පමණක් අ.ජ, වෙ.හා.ආ.ප්‍ර.දෙ වෙත මෙම නිර්දේශය කරන්න)**

නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් නිලධරයා / නිලධාරිනිය විශ්‍රාම ලබා ඇත්තේ වෛකල්පික / අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට පැමිණීමට පෙර නොවන බවත් හා විනය හේතුවක් මත නොවන බවත් විශ්‍රාම ගන්නා දිනයට පූර්වාසන්න වසර 05ක කාලය තුළ තීරු බදු සහන පදනම යටතේ වාහනයක් ආනයන කර නොමැති බව සහතික කරන අතර, පහත සඳහන් ලියකියවිලි වල පිටපත් මේ සමග එවමි.

| පිළිවෙල | ලියකියවිලි වර්ගය | අදාළ වේ | අදාළ නොවේ |
|---|---|---|---|
| 1. | විශ්‍රාම ගැන්වීමේ ලිපිය | | |
| 2. | සේවා කාලය වසර 25 ක් ඇති බව සනාථ කෙරෙන මුල් පත්වීමේ ලිපිය | | |
| 3. | සේවයේ/තනතුරේ I පන්තියට පත් කිරීමේ ලිපිය | | |
| 4. | විශේෂඥ වෛද්‍යවරයෙක් / විශේෂඥ දන්ත වෛද්‍යවරයෙක් ලෙස පත් කිරීමේ ලිපිය | | |
| 5. | භාණ්ඩාගාරය විසින් තනතුර අනුමත ලිපිය | | |
| 6. | මියගිය නිලධරයෙකු වෙනුවෙන් නම් මරණ සහතිකය, විවාහ සහතිකය | | |
| 7. | වෛද්‍ය සහතික මත විශ්‍රාම ගන්වා ඇති නිලධරයෙක් නම් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාව | | |
| 8. | මීට පෙර ලබා ගත් මෝටර් රථයට අදාළ ණයවර ලිපිය / ලියාපදිංචි කළ සහතිකය | | |

මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට යටත්ව සහනදායි වාහන ආනයන බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

.....................................................

දිනය ..............................                    දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

---

**'ඍ' කොටස**

**ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

**(ඉල්ලුම්කරු පළාත් සභා නිලධරයෙකු වන විට පමණක් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය)**

මගේ අංකය:-…………………………

ලේකම්

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය*

***(අදාළ පරිදි සදහන් කරන්න)**

මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට යටත්ව සහනදායි වාහන ආනයන බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

..........................................................

දිනය ..............................                    ප්‍රධාන ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

---

**'එ' කොටස**

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

මගේ අංකය :-…………………………

අධ්‍යක්ෂ ජනරාල්

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හා එහි සංශෝධිත විධිවිධාන යටතේ .................................... ..................................................................... මහතා/මෙය/මිය ට තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

.................................................

දිනය :- ......................................                    අමාත්‍යාශ ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව